රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 15/2007 (II)

මගේ අංකය : EST/7/LOANS/04/1040
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2014.12.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රජයේ සේවකයන් සඳහා බැංකු මඟින් දේපළ හා වාහන ණය ලබාදීම

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2007.06.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2007 හා 2009.11.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2007 (I) කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි. එම චක්‍රලේඛ අනුව බැංකු මඟින් ලබා දෙන දේපළ හා වාහන ණය සඳහා අයකළ යුතු පොලී අනුපාත 2015.01.01 දින සිට පහත සඳහන් අයුරින් සංශෝධනය කරනු ලැබේ.

| ණය මුදල(රුපියල්) | නිලධරයා විසින් ගෙවිය යුතු පොලී ප්‍රතිශතය | රජය විසින් ගෙවිය යුතු පොලී ප්‍රතිශතය | බැංකුවට ගෙවිය යුතු මුළු පොලී ප්‍රතිශතය |
|---|---|---|---|
| **දේපළ ණය** | | | |
| 500,000 දක්වා | **4%** | **6%** | **10%** |
| 500,001 සිට 1,000,000 දක්වා | **7%** | **3%** | **10%** |
| 1,000,001 සිට 3,000,000 දක්වා | **9%** | **2%** | **11%** |
| **වාහන ණය** | | | |
| වාහන ණය සඳහා පොලී අය කිරීම | **9%** | **2%** | **11%** |

02. ඉහත සංශෝධන අනුව ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 7.4.1 හා 11.5.1 උප වගන්තීන්හි සඳහන්, බැංකු මගින් ලබා දෙන දේපළ හා වාහන ණය සඳහා අයකළ යුතු පොලී අනුපාතයන් සම්බන්ධයෙන් වන විධිවිධාන සංශෝධනය කරනු ලැබේ.

03. සංශෝධිත පොලී අනුපාත 2015.01.01 දින හෝ එදිනට පසුව ලබා දෙනු ලබන දේපළ හා වාහන ණය සඳහා පමණක් අදාළ වන අතර, 2015.01.01 දිනට පෙර ලබා දී ඇති දේපළ හා වාහන ණය වෙනුවෙන් මේ වන විට ක්‍රියාත්මක වන පොලී අනුපාත තවදුරටත් බල පැවැත්වෙනු ඇත.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

පී. බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය